# රම්බඩගල්ල මොනරාගල සෙල්පිළිමය හා එහි ශිල්පීන් පිළිබඳව මානවවංශ අධ්‍යයනයක්

ආර්.ඒ.ඩී. මධුමාලි නිවන්තිකා රණසිංහ

පුරාවිද්‍යාව හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
donrox60@gmail.com

---

ශ්‍රී ලංකාව ලෝක ප්‍රසිද්ධ ශෛලමය ප්‍රතිමා රැසකට උරුමකම් කියන රටක් වුව ද ඒ හා බැඳුණු නිර්මාණ තාක්ෂණය, ගුරුකුල ආදිය පිළිබඳව තොරතුරු වර්තමානයේ ශේෂව ඇත්තේ අල්ප වශයෙනි. මෙම හිඩැස පිරවීම සඳහා වර්තමානයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රම්බඩගල්ල මොනරාගල විහාරස්ථානයේ ඉදිවෙමින් පවතින ලෝකයේ විශාලතම ශෛලමය සමාධි බුද්ධ ප්‍රතිමාව හා බැඳෙන ශිල්පීන් පිළිබඳව මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ අරමුණය. ක්ෂේත්‍ර අධ්‍යයනයට පිවිසීමට පෙර ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රතිමා නෙළීමේ ශිල්පය හා තාක්ෂණය සම්බන්ධයෙන් පුස්තකාල පරිශීලනය තුළින් පූර්ව අධ්‍යයනයන් සිදුකරන ලදී. අනතුරුව රම්බඩගල්ල විහාරයේ ශෛලමය ප්‍රතිමා නෙළීම සිදුකරන ස්ථානයට ගොස් එම ශිල්පීන් සමග සාකච්ඡා කිරීම තුළින් තොරතුරු ලබාගැනිණි. ක්ෂේත්‍රයට ගොස් ලබාගත් තොරතුරු සහ ග්‍රන්ථ පරිශීලනයෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

රම්බඩගල්ල මොනරාගල විහාරස්ථානයේ වර්තමානය වන විට නිමවෙමින් පවතින සමාධි බුද්ධ ප්‍රතිමාව වසර අටසියයකට ආසන්න නිහැඬියාවකට පසුව විශාල ප්‍රමාණයේ ශෛලමය ප්‍රතිමාවක් සම්පූර්ණ මිනිස් ශ්‍රමයෙන් ඉදිවන අවස්ථාවකි. මෙම පිළිමය අඩි 67.5 ක් උසට නිර්මාණය කිරීමට මුලින් තීරණය කළත් වර්තමානය වන විට එහි මුළු උස අඩි 75 ක් පමණ වේ. ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසනයෙන් ප්‍රතිමාව නිර්මාණය කර ඇත. මෙම පිළිමය නිර්මාණය කිරීමේ කටයුත්තට ලාංකීය ශිල්පීන් දායක නොවුණත්, ගඩලාදෙණිය විහාර කර්මාන්තයට දායක වූ 'ස්තපති' නම් පාරම්පරික ශිල්පී පරම්පරාවෙන් පැවත එන ඉන්දියාවේ එම්. එම්. ස්තපති නම් ශිල්පියා ප්‍රතිමාව නෙළීමේ ප්‍රධාන ශිල්පියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රතිමා නෙළීමේ කර්මාන්තයට මුල්කාලයේ සිටම ආසන්නතම රට වශයෙන් ඉන්දියාවෙන් ප්‍රබල බලපෑමක් එල්ලවී ඇත. මෙම නිර්මාණයට දායක වන ප්‍රධාන ශිල්පියා අතින් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය වන ප්‍රථම අවස්ථාව මෙය වන අතර ඔහු ඉන්දියාවේ ක්‍රිෂ්ණ, දුර්ගා වැනි විශාල ප්‍රමාණයේ දේව ප්‍රතිමා නිර්මාණය කර ඇත. මෙම අධ්‍යයනය ඔස්සේ ප්‍රතිමාව නිර්මාණය කිරීමට භූමිය තෝරාගැනීම, ශිල්පීන්ගේ මුල්ගම්, දෛනිකව වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර ඉටුකරන චාරිත්‍ර, ප්‍රතිමා ප්‍රමාණ විද්‍යාව, ප්‍රතිමාකරණය සඳහා භාවිත කරන ආයුධ, ඒවා මුවහත් කරන ආකාරය සහ මෙම ප්‍රතිමාවට අමතරව නිර්මාණය කර ඇති ශිලා නිර්මාණ හා ඒ සඳහා භාවිත කරන නවීන යන්ත්‍රෝපකරණ ආදිය පිළිබඳව අවධානය යොමුකර ඇත.

මෙම ප්‍රතිමාව ඉන්දියානු ශිල්පීන් අතින් නිම වුව ද මෙම අධ්‍යයනය තුළින් ලාංකීය ප්‍රතිමා නිර්මාණකරණයට ලැබුණු ඉන්දීය ආභාසයත්, ඔවුන් භාවිත කරන ශිල්පීය ක්‍රම ශ්‍රී ලංකාවට ආදේශ කිරීමෙන් ලාංකීය ශෛලමය ප්‍රතිමා නිර්මාණකරණය සම්බන්ධයෙන් නිගමනයන්ට එළඹීමටත් හැකි වේ.

ප්‍රමුඛ පද : රම්බඩගල්ල ප්‍රතිමාව, ස්තපති, ප්‍රතිමා නෙළීමේ ශිල්පය